සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- නර්තනය **අදාළ සතිය** :- පෙබරවාරි මාසය 1 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-තුන් තිතේ ප්‍රභේද දක්වමු..

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

- කියවීම් පත්‍රිකාවට අනුව කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

## තුන් තිතේ ප්‍රභේද

මාත්‍රා 2 තනි තිත, මාත්‍රා 3 තනි තිත මාත්‍රා 4 තනි තිත (සුළු, මැදුම්, මහ) යන මූලික තිත් රූප ආශ්‍රයෙන් දේශීය තාල ශාස්ත්‍රයේ විවිධ තිත් රූප ගොඩනැගී ඇත. තිත් රූප තුනක් එකතු වීමෙන් තුන් තිතේ තිත්රූප සෑදී ඇත. ඒ අනුව තුන් තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද දෙකක් හඳුන්වා දිය හැකි ය.

තුන්තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද

| දෙසුළු මැදුම් තුන්තිත | දෙසුළු මහ තුන් තිත |
|---|---|
| (මාත්‍රා 2+2+3) | (මාත්‍රා 2+2+4) |

තුන් තිතේ තාල ප්‍රභේද ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන සංකේත වන (^) තිත් යන තාල සංඥාව ද තෙයි (/) යන සංඥාව ද එකතු වීම නිසා තිත්, තිත් තෙයි යනුවෙන් භාවිත කෙරේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උදා : | ^ | | ^ | | / | | |
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |

තුන් තිතේ තිත් ප්‍රභේදයේ දී ඉහත සඳහන් කර ඇති ආකාරයට අඝාතය තැබීම සංකේතවත් කෙරේ.

| | | | |
|---|---|---|---|
| උදා : | තිත් | තිත් | තෙයි |
| | ^ | ^ | / |

### මාත්‍රා 2+2+3 (දෙසුළු මැදුම් තුන්තිත) තාලය

| | ∧ | | ∧ | | / | | | ∧ | | ∧ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| උඩරට | දොම් තතු | | දොම් තතු | | දොං | තිං | - | ගත් | - | තත් | - | තිං | තරි | කිට |
| පහතරට | දිත් | - | තම් | - | දි | ත | ම | දොං | - | දොං | - | තා | - | ම |
| සබරගමු | තත් | - | කි | ට | ත | ත | ට | ජි | මි | ත් | තු | දා | | |

| | ∧ | | ∧ | | / | | | | ∧ | | ∧ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| උඩරට | තු | ද | ග | ත | ග | ත | දොං | - | තු | ද | ග | ත | ග | ත | දොං | - |
| පහතරට | ග | දි | කි | ට | ග | ත | දොං | - | ගු | දි | කි | ට | ග | ත | දොං | - |
| සබරගමු | ජි | මි | ත | ග | තා | - | දොං | - | ජි | මි | ත | ග | තා | - | දොං | - |
| | තු | දි | ත | ග | තා | - | තු | ද | තු | දි | ත | ග | තා | - | තු | ද |

- **හිස්තැනට ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. තුන් තිතේ ප්‍රභේද ............. කි.

(1). 4 කි (2). 6 කි (3). 8 කි (4). 10 කි

02. දෙසුළු මැදුම් තුන් තිතේ තාල රූපය ............ වේ.

(1). 2 + 2 + 3 (2). 3 + 3 + 2 (3). 2 + 3 + 2 (4). 3 + 2 + 3

03. තුන් තිතේ තිත් රූපය සෑදීමට,.............................................

(1). තිත් 4 ක් ඇත. (2). තිත් 3 ක් ඇත. (3). තිත් 2 ක් ඇත. (4). තිත් 1 ක්ඇත.

04. දෙසුළු මැදුම් තුන් තිතට මාත්‍රා ..................................කි.

(1). 7 (2). 8 (3). 9 (4). 10

05. " ∧ ∧ / " යන සංකේතවලින් ................................ ලෙස දැක්විය හැකිය.

(1). තෙයි තෙයි තිත් (2). තෙයි තිත් තෙයි (3). තිත් තිත් තෙයි (4). තිත් තෙයි තිත්

(ලකුණු 3 × 5 = 15)

**4. ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි පොත් හා ඉගෙනුම් ආධාරක :-**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත

You tube නාලිකා :- **:-**

**5. ඉගෙනුම්ඵල:-**

- තුන් තිතේ ප්‍රභේද විස්තර කරයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියයි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය

- **ගැලපෙන පද යොදා හිස්තැන් පුරවන්න.**

01. තාලතැබීමට යොදා ගන්නා තාල වාද්‍ය භාණ්ඩය වන්නේ ...................................... යි.

02. "කුදාංත ගත දොං" වට්ටම නටන්නේ ...................................... තිතටය.

03. "කුද ගත ගත දොං" යන බෙර පදය තාල තැබිය හැක්කේ ...................................... තිතටය.

04. දෙසුළු මැදුම් තුන් තිතට අයත් බෙර පදයකි, ......................................

05. "කුද ගත ගත දොං" යන බෙර පදයට මාත්‍රා ...................................... ක් ඇත.

(ලකුණු $3 \times 5 = 15$)

- **ප්‍රස්තාර කර දක්වන්න.**

01. දෙසුළු මහ තුන් තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කර දක්වන්න.

02. 2 + 2 + 3 තාල රූපයට සුදුසු බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

ඉගෙනුම් ආධාරක

https://www.youtube.com/watch?v=KyLYIU8BB-U

https://www.youtube.com/watch?v=qwvqk6_DwnE